# නිරවද්‍ය ගමන් මඟ: බාධක ජය ගැනීම / පැහැදිලි දැක්මෙන් සීමා මායිම් බිඳලීම

## ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ දෘෂ්ටිකෝණය / ඉදිරි දැක්ම

**කැපවූ කණ්ඩායම්, දත්ත මත පදනම් වූ වඩාත් පැහැදිලි ව්‍යාපාරික නිරීක්ෂණ සහ අනාගතයට සන්නද්ධ ශ්‍රම බලකායක් සමඟින්, අපගේ උපායමාර්ගයන් සාර්ථක ක්‍රියාකාරීත්වයක් බවට පත් කිරීමටත්, එම ක්‍රියාකාරීත්වය මැනිය හැකි ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමටත් අපි දැන් වඩාත් හොඳින් සන්නද්ධව සිටින්නෙමු. අප අනාගතය දෙස බලන්නේ දැඩි සුභවාදී හැඟීමකින් සහ අලුත් වූ අධිෂ්ඨානයකිනි. ඒ අනුව, නිරවද්‍යතාවයෙන් යුතුව පෙරමුණ ගැනීමටත්, ව්‍යාපාරික කාර්යසාධනයේ සහ පරිවර්තනයේ පවතින බාධක බිඳ දැමීමටත්, අපගේ සියලුම පාර්ශවකරුවන්, පරිසරය මෙන්ම සමස්ත ජාතිය වෙනුවෙන් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමටත් අපි සැමවිටම සූදානම්ව සිටින්නෙමු.**



මූල්‍ය වර්ෂය පිළිබඳ සමූහ කළමනාකාර අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ බහුභාෂා වීඩියෝ, ශ්‍රව්‍ය සහ PDF වාර්තාව සඳහා පිවිසෙන්න.

https://www.dimolanka.com/2025-2026-dimo-annual-report/url.php?id=7

හිතවත් පාර්ශවකරුවනි,

අභියෝග මෙන්ම ප්‍රතිලාභ ද එකලෙස මිශ්‍ර වූ වසරක් අවසානයේ, අපගේ 16 වන ඒකාබද්ධ වාර්ෂික වාර්තාව හරහා ඔබ ඇමතීමට ලැබීම මා තුළ ඉහළ තෘප්තියක් සහ නව බලාපොරොත්තුවක් ඇති කිරීමට හේතු වෙයි. සලකා බලනු ලබන වසර සමූහයේ ශක්තිමත් නැවත පැමිණීමක් සනිටුහන් කළ කාල පරිච්ඡේදයක් වූ අතර, එහිදී අපගේ කාර්යසාධනය නැවත නංවාලීමටත්, වර්ධන වේගය යළි ගොඩනැඟීමටත්, ව්‍යාපාරයේ මීළඟ වර්ධන හා පරිවර්තන අදියර සඳහා අවශ්‍ය පසුබිම සකස් කිරීමට අප වූ පොරොන්දු අපි ඒ අයුරින්ම ඉටු කළෙමු..

අභියෝග හමුවේ වුවද, අපගේ අගයන් පෙරදැරි කරගනිමින් සහ පාර්ශවකරුවන් උදෙසා දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කිරීමේ අපගේ කැපවීම මත පදනම් වෙමින්, අපි අපගේ අරමුණු තුළ නොසැලී සිටියෙමු. අප මෙම කාල සීමාව භාවිත කළේ වෙළඳපොළ පීඩනයන්ට ඔරොත්තු දීමට පමණක්ම නොව, ගැඹුරු වෘත්තීය විශේෂඥතාව, වඩාත් තියුණු තාක්ෂණය සහ සවිබල ගැන්වූ දක්ෂතා ඔස්සේ අපගේ ආයතනය තවදුරටත් ශක්තිමත් කිරීමටයි. ඒ අනුව, අලුත් වූ විශ්වාසයකින් සහ වඩාත් පැහැදිලි දිශානතියකින් යුතුව, අපි නිරවද්‍යතාවයෙන් පෙරමුණ ගත්තෙමු.

එහිදී පවතින බාධක බිඳ දමමින්, ඒවායින් ඔබ්බෙහි ඇති නව ව්‍යාපාරික අවස්ථාවන් සාර්ථකව අප සතු කර ගැනීමට ද අපට හැකි විය.

### ගෝලීය අභියෝග සහ දේශීය වෙළඳපොළ ප්‍රවණතාවන් කළමනාකරණය කිරීම

සලකා බලනු ලබන කාල පරිච්ඡේදය ගෝලීය ආර්ථිකය ක්‍රමයෙන් ස්ථාවර වූ වකවානුවක් ලෙස හැඳින්විය හැකි වුවද, එය අඛණ්ඩව පැවති භූදේශපාලනික අවිනිශ්චිතතාවයන්, බලශක්ති මිලෙහි උච්චාවචනයන්, ඉහළ මූල්‍ය පිරිවැය, දේශගුණික විපර්යාසයන්ගෙන් එල්ල වූ බාධා සහ වෙළඳ රටාවන්හි සිදුවන වෙනස්වීම්වලට සෘජුවම නිරාවරණය වී පැවතුණි. එසේම, නැව් මාර්ග අවහිර වීම් සහ ප්‍රවාහන ගාස්තු නිරන්තරයෙන් වෙනස් වීම හේතුවෙන් සැපයුම් දාමයන්හි විශ්වාසනීයත්වය ද ප්‍රධාන ගැටලුවක් ලෙස පැවති අතර, එය ආනයන මත යැපෙන ආර්ථිකයන්ට සහ ජාත්‍යන්තරව අනුබද්ධිත කර්මාන්තයන්ට බෙහෙවින් බලපෑවේය.

දකුණු ආසියානු කලාපය තුළ, දේශීය පරිභෝජනය, යටිතල පහසුකම් ආයෝජන සහ සේවා අංශයන්හි දායකත්වය හේතුවෙන් ආර්ථික වර්ධනය සාපේක්ෂව ඔරොත්තු දීමේ හැකියාවකින් යුක්ත විය.

කෙසේ වෙතත්, බලශක්ති ආනයනය මත යැපීම, විදේශ විනිමය අනුපාතිකයන්හි චලනයන්, ආහාර උද්ධමනය, දේශගුණික අවදානම් සහ අපනයන ඉල්ලුම ඒකාකාරී නොවීම වැනි කරුණු හේතුවෙන් සමස්ත කලාපයම අඛණ්ඩ පීඩනයකට මුහුණ දුන්නේ ය. ආනයනික ඉන්ධන, අමුද්‍රව්‍ය, යන්ත්‍ර සූත්‍ර සහ පාරිභෝගික භාණ්ඩ මත ශ්‍රී ලංකාව බෙහෙවින් රඳා පැවතීමත්, විදේශ විනිමය උපයා ගැනීම සඳහා සංචාරක ව්‍යාපාරය, විදේශ ප්‍රේෂණ සහ අපනයන ක්ෂේත්‍ර කෙරෙහි විශ්වාසය තැබීමට සිදු වීමත් නිසා, මෙම කලාපීය ප්‍රවණතාවන් ශ්‍රී ලංකාවට සෘජුවම බලපෑවේය.

සාර්ව ආර්ථික ස්ථාවරත්වය වර්ධනය වීම, අඩු උද්ධමන වේගය, පොලී අනුපාත පහත වැටීම, සංචාරක පැමිණීම් සහ විදේශ ප්‍රේෂණ ඉහළ යාම මෙන්ම පෞද්ගලික අංශයේ ණය පහසුකම් ක්‍රමයෙන් ප්‍රාණවත් වීම වැනි සාධනීය ලකුණු හේතුවෙන් ශ්‍රී ලංකාව සලකා බලනු ලබන වසර තුළ සිය ආර්ථිකය යථා තත්ත්වයට පත් කර ගැනීම අඛණ්ඩව ඉදිරියට රැගෙන ගියේය. එසේ වුවද, පවුල් ඒකකවල භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව (ක්‍රය ශක්තිය), බදු පැනවීම්, ආනයන පිරිවැය, දේශගුණික බලපෑම් සහ රාජ්‍ය අංශයේ මූල්‍යමය සීමාවන් ව්‍යාපාරික ක්‍රියාකාරකම් කෙරෙහි දිගින් දිගටම බලපෑම් එල්ල කළ බැවින්, මෙම ආර්ථික පිබිදීම පැවතියේ පාලනය වූ මට්ටමකය. 'දිට්වා' සුළි කුණාටුවෙන් එල්ල වූ බලපෑම, දේශගුණික කම්පන හමුවේ රට සතු අවදානම තවදුරටත් මැනවින් තහවුරු කළ අතර, ඉන් කෘෂිකර්මාන්තය, යටිතල පහසුකම්, සැපයුම් ක්‍රියාවලිය සහ ග්‍රාමීය ජන ජීවිතය අඩාල විය. මෙය දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තු දීමේ හැකියාව, ව්‍යාපාරික අඛණ්ඩතාව සහ අනුවර්තනය විය හැකි යටිතල පහසුකම්වල ඇති වැදගත්කම නැවත වරක් සිහිපත් කර දුන්නේය.

**DIMO සමූහයේ ආදායම් වර්ධනය %**

**107%**

**DIMO සමූහයේ බදු පසු ලාභ වර්ධනය %**

**218%**

| | |
|---|---|
| දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධනය | ↑ 5% |
| කෘෂිකර්ම ක්ෂේත්‍රයේ වර්ධනය | ↑ 1.4% |
| කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය | ↑ 7.8% |
| සේවා ක්ෂේත්‍රයේ වර්ධනය | 3.3% |

මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ආර්ථික විමර්ශනය 2025 / මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

මෙවැනි පසුබිමක ක්ෂේත්‍රයේ සමස්ත කාර්යසාධනය මිශ්‍ර ස්වභාවයක් ගත්ත ද, ශක්තිමත් වෙළඳපොළ පදනමක්, විනයගරුක පිරිවැය ව්‍යුහයක්, ඔරොත්තු දෙන සැපයුම් දාමයක් සහ පාරිභෝගිකයාගේ මෙන්ම කර්මාන්තයේ වෙනස්වන ප්‍රවණතාවලට කඩිනමින් හැඩගැසීමේ හැකියාව සතු ව්‍යාපාර සඳහා, මෙම මෙහෙයුම් පරිසරය තුළ සුවිශේෂී අවස්ථාවන් උදා වී තිබුණි.

## අරමුණෙහි නොසැලී, නිරවද්‍යතාවයෙන් පෙරමුණට

අපගේ අරමුණ වන 'සිහින හා අභිලාෂයන් බලගැන්වීම' සහ අපගේ පාර්ශවකරුවන් වෙනුවෙන් වූ 'විශ්වාසවන්තම හවුල්කරුවා' යන සන්නාම පොරොන්දුව, අපගේ ව්‍යාපාරික ගමන් මඟෙහි සැමවිටම අපට මඟපෙන්වීය. අපගේ උපායමාර්ගික දිශානතිය තීරණය කිරීමේදීත්, ව්‍යාපාරික ප්‍රමුඛතාවන් පෙළගැස්වීමේදීත්, අප සේවය කරන පාර්ශවකරුවන් සමඟ අර්ථවත් ලෙස සම්බන්ධ වීමේදීත් ඒවා සැමවිටම කේන්ද්‍රීය සාධක ලෙස පවතියි.

වෙනස්වන මෙහෙයුම් වටපිටාව කළමනාකරණය කිරීමේ දී, අපගේ ප්‍රධාන උපායමාර්ගික කුළුණු/මෙවලම් ත්‍රිත්වය වන විවිධාංගීකරණය, සුවිශේෂීකරණය සහ සහයෝගීතාවය පෙරදැරි කරගනිමින්, දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමේ අපගේ කැපවීම තුළ අපි නොසැලී සිටියෙමු. මෙම කුළුණු/මෙවලම් ත්‍රිත්වය ප්‍රධාන උපායමාර්ගික ප්‍රමුඛතාවන් නවයක් ඔස්සේ සමස්ත සංවිධානය පුරාම ක්‍රියාවට නංවා ඇති අතර, ඒ පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු මෙම වාර්තාවේ 'අරමුණ මත පදනම් වූ උපායමාර්ගය' යන කොටසෙහි ඇතුළත් කර ඇත.

සලකා බලනු ලබන වසර තුළ, අපගේ මූල්‍ය, මානව, බුද්ධිමය, සමාජීය හා සබඳතා, නිෂ්පාදිත සහ ස්වාභාවික ප්‍රාග්ධනයන් අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන් සමඟ වඩාත්ම ගැළපෙන අවස්ථාවන් වෙත යොමු වන බව සහතික කරමින්, ප්‍රාග්ධන යෙදවීම සම්බන්ධයෙන් අපි ඉතා විනයගරුක සහ විචක්ෂණශීලී ප්‍රවේශයක් අනුගමනය කළෙමු. එමඟින්, නිරවද්‍යතාවයෙන් යුතුව වර්ධනය කරා ගමන් කිරීමටත්, ආයතනික ධාරිතාවය ශක්තිමත් කිරීමටත්, අපගේ පාර්ශවකරුවන් වෙත වඩාත් ඉලක්කගත හා තිරසාර අයුරින් වටිනාකම් ළඟා කර දීමටත් අපට අවස්ථාව සැලසුණි.

## ඒකාබද්ධ චින්තනය සහ නිරවද්‍යතාවය මත පදනම් වූ අගය නිර්මාණය

අපගේ ව්‍යාපාරය තුළ ඒකාබද්ධ භාරකාරත්වයක් පවත්වා ගැනීමට අපි කැපවී සිටින්නෙමු. එහිදී ආයතනික අරමුණ, උපායමාර්ගය, ප්‍රාග්ධන වෙන්කිරීම, කාර්යසාධනය සහ වාර්තාකරණය යන සියල්ල පැහැදිලි වටිනාකම් නිර්මාණය කිරීමේ මානසිකත්වයක් ඔස්සේ එකිනෙකා හා බද්ධ වී පවතියි. අපගේ උපායමාර්ගය ගොඩනැඟී ඇත්තේ අපගේ අරමුණ සහ සන්නාම පොරොන්දුව වටා වන අතර, එය අපගේ වටිනාකම් මඟින් මෙහෙයවනු ලබයි. එමඟින් අපගේ පාර්ශවකරුවන්ගේ දිගුකාලීන අන්‍යෝන්‍ය අවශ්‍යතාවන් සමඟ සැමවිටම අනුගත වීම සහතික කෙරේ.

මෙම ප්‍රවේශයේ කේන්ද්‍රස්ථානය වන්නේ ඒකාබද්ධ චින්තනයයි. අපගේ දිගුකාලීන සහ වාර්ෂික සැලසුම්කරණ ක්‍රියාවලීන්හි කොටසක් ලෙස අපි ප්‍රධාන ප්‍රාග්ධන හය සහ ඒවා සපයන්නන් හඳුනා ගනු ලබන අතර,

**රජයේ බදු ආදායම් වර්ධනය ***

**36.3%**

**ගෙවූ බදු ප්‍රමාණය වැඩිවීම**

**56%**

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුවේ 2025 වාර්ෂික ආර්ථික සමාලෝචනය / මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

එමඟින් කෙටිකාලීන, මධ්‍යකාලීන සහ දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීමට සහාය වීම සඳහා විවිධ ව්‍යාපාරයන් පුරා නිරවද්‍යතාවයෙන් යුතුව ප්‍රාග්ධනය වෙන්කිරීමට අපට අවස්ථාව සැලසේ.

මෙය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම සඳහා, අපගේ සමස්ත වටිනාකම් දාමයන් පුරා උපායමාර්ග, ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය, තිරසාරත්වය, කාර්යසාධන අධීක්ෂණය සහ පාර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණය පිළිබඳ වගකීම් දැරීම සඳහා කැපවූ කණ්ඩායම්, ව්‍යුහයන් සහ කාර්යභාරයන් අපි ස්ථාපිත කර ඇත්තෙමු. මෙම යාන්ත්‍රණයන් මඟින් ඒකාබද්ධ චින්තනය, අර්ථවත් සම්පත් වෙන්කිරීමක්, විනයගරුක තීරණ ගැනීමක් සහ ඔරොත්තු දෙන ක්‍රියාකාරීත්වයක් බවට පරිවර්තනය කරනු ලබයි. එමඟින්, දුෂ්කර කාල පරිච්ඡේදයන්හිදී අප සතු ප්‍රාග්ධනයන් ක්ෂය වීම අවම කර ගනිමින්, ඒවා ආරක්ෂා කිරීමට, පෝෂණය කිරීමට සහ තවදුරටත් වර්ධනය කිරීමට අපට උපකාරී වේ.

අපගේ පාර්ශවකරුවන් පිළිබඳ ප්‍රවේශය සාම්ප්‍රදායික සීමාවන්ගෙන් ඔබ්බට විහිදෙන අතර, එහිදී ස්වභාවධර්මය සහ සමස්ත ජාතිය අපගේ ව්‍යාපාරයේ තිරසාරත්වයට සහ අප ඉතිරි කර යන උරුමයට සෘජුවම සම්බන්ධ වැදගත් පාර්ශවකරුවන් ලෙස අපි පිළිගනිමු.

රටේ ශ්‍රම බලකාය වෙනුවෙන් දායක කළ, මෝටර් රථ ඉංජිනේරු ක්ෂේත්‍රයේ සුදුසුකම් ලත් ඉංජිනේරුවන් සංඛ්‍යාව

**46**

(2024/25: 33)

තාක්ෂණික අධ්‍යාපනය වෙනුවෙන් පිරිනමන ලද පූර්ණ ශිෂ්‍යත්ව සංඛ්‍යාව

**23**

(2024/25: 15)

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ දෘෂ්ටිකෝණය / ඉදිරි දැක්ම

සමස්ත හරිතාගාර වායු විමෝචනය

**657,005** $tCO_2e$

(2024/25- 222,581 $tCO_2e$)

ජාතික විදුලි බල පද්ධතියට මුදාහරින ලද පුනර්ජනනීය බලශක්ති ප්‍රමාණය

**87,138** GJ

(2024/25- 17,431)

ඒකාබද්ධ කාර්යසාධනය මගින් මෙම චින්තනය සැබෑවක් බවට පත් කරන්නේ, අපගේ ක්‍රියාකාරීත්වය උපායමාර්ගය සමඟ පෙළගැස්වීම, අදාළ දර්ශකයන්ට සාපේක්ෂව ප්‍රගතිය මැනීම සහ මූල්‍ය ප්‍රතිඵල හා පුළුල් පාර්ශවකරුවන්ගේ වටිනාකම් අතර පවතින බාධක බිඳ දැමීමෙනි. වර්ෂය අවසානයේ දී, මෙම කාර්යසාධනය ඒකාබද්ධ වාර්තාකරණයක් බවට පරිවර්තනය කෙරෙන අතර, එමගින් අප අපගේ ප්‍රාග්ධනයන් භාවිත කළේ, ආරක්ෂා කළේ සහ වර්ධනය කළේ කෙසේද යන්න පිළිබඳ විශ්වසනීය සහ විනිවිදභාවයකින් යුත් පැහැදිලි විස්තරයක් සපයයි.

අව්‍යාජ වටිනාකම් නිර්මාණය කිරීම සඳහා ඒකාබද්ධ චින්තනය සහ ඒකාබද්ධ කාර්යසාධනය මූලික පදනම වන බව අපි විශ්වාස කරන අතර, ඒකාබද්ධ වාර්තාකරණය මගින් මෙම ක්‍රියාවලිය ඉදිරියට ගෙන යන වගකීම, විනය සහ විශ්වසනීයත්වය තවදුරටත් ශක්තිමත් කරනු ලබයි.

### අලුත් වූ වර්ධනයක් කරා බාධක බිඳ දැමීම

සලකා බලනු ලබන වර්ෂය ආරම්භ වූයේ, දේශීය ආර්ථිකය තුළ යම් යම් සීමාවන් පැවතිය ද, සුභවාදී සහ දිරිගන්වනසුලු ප්‍රකෘතිමත් වීමේ ලක්ෂණ පෙන්නුම් කළ වටපිටාවකිනි. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් ක්‍රමයෙන් පුනර්ජීවනය වීම, වාහන ආනයන සීමාවන් ඉවත් කිරීම, පුනර්ජනනීය බලශක්ති ක්ෂේත්‍රය කෙරෙහි ඇති උනන්දුව වර්ධනය වීම සහ කෘෂිකර්මාන්තයේ ප්‍රගතිය පිළිබඳව පවතින සාපේක්ෂ සුභවාදී අපේක්ෂාවන් යන කරුණු සියල්ල, පෙර වසරේ අත්විඳි පසුබෑමෙන් පසුව මෙම මූල්‍ය වර්ෂය ආරම්භයේ දී ව්‍යාපාරයට නව ජවයක් ලබා දීමට සමත් විය. මෙම වසර තුළ අප අත්පත් කරගත් විශිෂ්ට කාර්යසාධනය, සමූහය පුරා විසිරී සිටින අපගේ කණ්ඩායම් සතු උපායමාර්ගික අනුගත වීම, ඔරොත්තු දීමේ හැකියාව සහ නොසැලෙන කැපවීම මැනවින් පිළිබිඹු කරන්නකි.

### ප්‍රවාහන ක්ෂේත්‍රය

ප්‍රවාහන ව්‍යාපාරික අංශය, සමූහයේ කැපී පෙනෙන ආර්ථික පිබිදීමට ඉහළම දායකත්වයක් සපයමින්, සිය ප්‍රධාන වර්ධන ගාමක බලවේගය ලෙස නැවත වරක් පෙරමුණට පැමිණියේය. ආනයන සීමාවන් ඉවත් කිරීමත් සමඟ ශ්‍රී ලංකාවේ රථවාහන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් නැවත ප්‍රාණවත් වූ නමුත්, බදු පැනවීම්, විදේශ විනිමය අනුපාතිකයන්හි චලනයන්, මූල්‍ය පිරිවැය සහ ලීසිං පහසුකම් සඳහා වන සීමාවන් හේතුවෙන් පාරිභෝගිකයින්ට වාහන මිලදී ගැනීමේ හැකියාව කෙරෙහි දිගින් දිගටම බලපෑම් එල්ල විය. එමෙන්ම, ඉන්ධන පිරිමැසුම්දායක, හයිබ්‍රිඩ් සහ නැඟී එන විද්‍යුත් වාහන මාදිලි ඔස්සේ තරඟකාරී මිල ගණන් යටතේ නව සන්නාම වෙළඳපොළට පිවිසීමත් සමඟ, සමස්ත ව්‍යාපාරික වටපිටාව ද සැලකිය යුතු පරිවර්තනයකට ලක් විය.

මෙලෙස දැඩි තරඟකාරීත්වයක් පැවති පසුබිමක වුවද, ප්‍රවාහන අංශය ශක්තිමත් මූල්‍ය වර්ධනයක් අත්පත් කර ගනිමින් සමස්ත සමූහයේ සාර්ථකත්වයට සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නේය. පැහැදිලි උපායමාර්ගික අවධානය, වෙනස්වන පාරිභෝගික අවශ්‍යතා සහ අභිලාෂයන් පිළිබඳ මනා අවබෝධය, අප නියෝජනය කරන ප්‍රධාන ජාත්‍යන්තර සන්නාමයන්හි විශ්වසනීයත්වය සහ වෙළඳපොළ ඉල්ලුමට ගැළපෙන නිෂ්පාදන හඳුන්වා දීමට හැකි වීම මීට ප්‍රධාන වශයෙන් හේතු විය. මේ හා සමානවම වැදගත් වූයේ, වෙළඳපොළ තුළ අපව සුවිශේෂී ලෙස කැපී පෙනීමට සැලැස්වූ, පාරිභෝගික විශ්වාසය තහවුරු කළ සහ අපගේ තරඟකාරී ස්ථාවරය ශක්තිමත් කළ DIMO ආයතනයේ විශ්වාසනීය සහ පාරිභෝගික සබඳතා මත පදනම් වූ අලෙවියෙන් පසු සේවා අත්දැකීමයි.

වෙළඳපොළ බාධක බිඳ දැමීම සඳහා වූ අලුත් වූ ජවය සහ ඉලක්කගත උපායමාර්ගයන් සමඟින්, මෙම ව්‍යාපාරික අංශය නොසැලෙන විශ්වාසයකින් සහ පැහැදිලි වර්ධන මාවතක් ඔස්සේ 2026/27 මූල්‍ය වර්ෂයට පාතබා සිටියි.

### මෝටර් රථ ඉංජිනේරු විසඳුම්

මෝටර් රථ ඉංජිනේරු විසඳුම් ව්‍යාපාරික අංශය, වර්ධනය වන තරඟකාරී රථවාහන වෙළඳපොළක් තුළ සමස්ත ප්‍රවාහන ව්‍යාපාරය වෙනුවෙන් සුවිශේෂී අනන්‍යතාවයක් ගොඩනඟා දීමට සමත් වූ අතර, එය පාරිභෝගිකයින් මෙන්ම අපගේ ජාත්‍යන්තර මව් සමාගම් වෙනුවෙන් ද විශ්වාසනීයත්වයේ ප්‍රධාන කුළුණක් ලෙස අඛණ්ඩව ක්‍රියා කළේය. අලෙවියෙන් පසු සේවා සහ තාක්ෂණික සහාය ලබා දීමේ එහි මූලික කාර්යභාරයට ඔබ්බෙන් යමින්, මෙම අංශය සමූහයේ සමස්ත කාර්යසාධනය සඳහා ද අර්ථවත් දායකත්වයක් සපයන ව්‍යාපාරයක් ලෙස මේ වන විට ස්ථාපිත වී ඇත.

රථවාහන ආනයන සීමාවන් පනවා තිබූ කාල පරිච්ඡේදය තුළ, පාරිභෝගිකයින්ට ඔවුන්ගේ වාහනවල ගුණාත්මකභාවය ඉහළින්ම පවත්වා ගැනීමටත්, විශ්වාසනීයත්වය, අඛණ්ඩතාව සහ පිරිවැය කාර්යක්ෂමතාවයකින් යුතුව සිය දෛනික මෙහෙයුම් කටයුතු කරගෙන යාමටත් මෙම අංශය තීරණාත්මක කාර්යභාරයක් ඉටු කළේය. සලකා බලනු ලබන වසර තුළ රථවාහන වෙළඳපොළ ප්‍රකෘතිමත් වීමත් සමඟ, ධාරිතාවය ඉහළ නැංවීම, පහසුකම් වැඩිදියුණු කිරීම, තාක්ෂණික නවීකරණයන් සහ කණ්ඩායම්වල කුසලතා වර්ධනය කිරීම ඔස්සේ අලුත් වූ වෙළඳපොළ ඉල්ලුමට සාර්ථකව මුහුණ දීම සඳහා මෙම ව්‍යාපාරික අංශය සිය සූදානම තවදුරටත් ශක්තිමත් කළේය. මෙම මූලපිරීම් මගින් රට තුළ වර්ධනය වන වාහන ගහනයට කාර්යක්ෂම සේවාවක් සැපයීමටත්, විද්‍යුත් වාහන තාක්ෂණය ඇතුළු නැඟී එන නවීන තාක්ෂණයන් සමඟ කඩිනමින් බද්ධ වීමටත් ව්‍යාපාරයට අවශ්‍ය පසුබිම සකසා දී ඇත.

සමුද්‍රීය සහ දුම්රිය ක්ෂේත්‍ර ආශ්‍රිත ව්‍යාපාර මෙන්ම ඒවාට අදාළ අලෙවියෙන් පසු සේවා ද මෙම අංශයේ සාර්ථකත්වයට කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන් අතර, එමගින් අප සතු ඉංජිනේරුමය හැකියාවන්හි ඇති විවිධාංගීකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව මැනවින් ප්‍රදර්ශනය විය.

අපගේ අධ්‍යාපන අංශය, කොළඹට ආසන්න ප්‍රදේශයකට ස්ථානගත කිරීම මගින් පාරිභෝගික ප්‍රවේශය තවදුරටත් පහසු කරලීමටත්, එහි පාඨමාලා මාලාවන් වඩාත් උසස් මට්ටමකට නංවාලීමටත්, විදේශීය අධ්‍යාපන ආයතන සමඟ පවතින සබඳතා පුළුල් කර ගැනීමටත් කටයුතු කළ අතර, එමගින් සිය උපායමාර්ගික ස්ථාවරය තවදුරටත් ශක්තිමත් කර ගත්තේය. ක්ෂේත්‍රයට ගැලපෙන තාක්ෂණික හා වෘත්තීය අධ්‍යාපනය සඳහා දිනෙන් දින වර්ධනය වන ඉල්ලුමට වඩාත් සාර්ථකව දායක වීමට මෙමඟින් එම අංශයට අවස්ථාව සැලසේ.

අනාගතය දෙස බලන කල, 2026/27 මූල්‍ය වර්ෂය තුළ දිගුකාලීන වර්ධනයක් අත්පත් කර ගැනීම සඳහා සහ පාරිභෝගිකයින් සමඟ පවතින සබඳතා ශක්තිමත් කරන ප්‍රධාන බලවේගයක් ලෙස, මෝටර් රථ ඉංජිනේරු විසඳුම් අංශය තවදුරටත් බලගැන්වීම කෙරෙහි සමූහය සිය අවධානය ස්ථාවරව යොමු කර ඇත.

### කෘෂිකර්ම ක්ෂේත්‍රය

ජාතික මට්ටමින් කෘෂිකාර්මික වර්ධනය පාලනය වූ වේගයකින් ඉදිරියට ඇදුණු වකවානුවක, අපගේ කෘෂිකර්ම ව්‍යාපාරික අංශය පසුගිය වසරට සාපේක්ෂව කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කරගත් අතර, එමගින් සමූහයේ විවිධාංගීකරණ සැලසුම් තුළ එහි ඇති උපායමාර්ගික වැදගත්කම නැවත වරක් තහවුරු කළේය. දේශගුණික හා කාලගුණික විපර්යාසයන්ගෙන් එල්ල වූ බාධා, අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යාමේ පීඩනය සහ ගෝලීය තත්ත්වයන් හේතුවෙන් ඇති වූ සැපයුම් දාමයන්හි සීමාවන් මධ්‍යයේ වුවද, කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර

අංශයේ විශිෂ්ට කාර්යසාධනය සහ කෘෂිකාර්මික යෙදවුම් අංශයෙන් ලැබුණු අර්ථවත් දායකත්වය මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු විය. එහිදී කෘෂිකාර්මික යන්ත්‍ර සූත්‍ර අංශය, දැඩි තරඟකාරී වටපිටාවක් තුළ සිය වෙළඳපොළ කොටස පුළුල් කර ගැනීම සඳහා නිවැරදි හා ක්‍රමෝපායික ප්‍රවේශයක් අනුගමනය කරමින් සැලකිය යුතු ප්‍රගතියක් වාර්තා කළේය.

කෘෂිකාර්මික යෙදවුම් ව්‍යාපාරය, ඉහළ අස්වැන්නක් ලබා ගැනීම, පිරිවැය කාර්යක්ෂමතාවය සහ තිරසාර කෘෂිකාර්මික භාවිතයන් සඳහා වන වෙළඳපොළ අවශ්‍යතාවන් සාර්ථකව සපුරාලමින් සිය දායකත්වය ශක්තිමත් කළේය. කෘෂිකර්මාන්තය වර්තමානයේ පවතින දේශගුණික විපර්යාසයන්ට සහ සම්පත් සීමිත වීමට මුහුණ දෙමින් සිටින බැවින්, විශ්වාසනීය යෙදවුම්, තාක්ෂණය පදනම් කරගත් විසඳුම් සහ විශ්වාසවන්ත උපදේශන සේවාවන් සඳහා වන ඉල්ලුම ඉදිරියේ දී තවදුරටත් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෘෂිකාර්මික ආහාර අංශය, සිය සන්නාමයන්හි වටිනාකම තවදුරටත් ඉහළ නංවමින්, දේශීය මෙන්ම අපනයන වෙළඳපොළ තුළ Flava සහ Miditer යන සන්නාමයන්හි පවතින සක්‍රීය දායකත්වය තහවුරු කළේය. මෙම මුලපිරීම්වල සම්පූර්ණ ප්‍රතිඵල නෙළා ගැනීමට යම් කාලයක් ගතවනු ඇතත්, දැනට දමා ඇති ශක්තිමත් පදනම අනාගත වර්ධනය සඳහා ඉතා හොඳ වේදිකාවක් සපයයි.

කෘෂිකර්මාන්තය යනු සමූහයේ දිගුකාලීන විවිධාංගීකරණ උපායමාර්ගය තුළ සැමවිටම ප්‍රමුඛතාවක් ගන්නා ක්ෂේත්‍රයකි. 2026/27 මූල්‍ය වර්ෂය දෙස බලන කල, අපගේ කර්මාන්තය වඩාත් උසස් තාක්ෂණික කෘෂිකාර්මික විසඳුම් කරා මෙහෙයවමින්, පවතින වර්ධන වේගය තවදුරටත් ඉදිරියට රැගෙන යාමට මෙම ව්‍යාපාරික අංශය සමත් වනු ඇතැයි අපි විශ්වාස කරමු.

## බලශක්ති ඉංජිනේරු සහ ගොඩනැඟිලි තාක්ෂණික විසඳුම්

පුනර්ජනනීය බලශක්තිය සහ වඩාත් ස්මාර්ට් යටිතල පහසුකම් විසඳුම් කරා ගෝලීය හා දේශීය වශයෙන් සිදුවන ශීඝ්‍ර සංක්‍රමණය හේතුවෙන්, බලශක්ති ඉංජිනේරු සහ ගොඩනැඟිලි තාක්ෂණික විසඳුම් ක්ෂේත්‍රයන් දැනට තාක්ෂණය මුල් කරගත් වේගවත් පරිවර්තනයකට ලක් වෙමින් පවතියි. මෙම වෙනස්වන වටපිටාව විසින් වෙළඳපොළ අවස්ථා, පාරිභෝගික අපේක්ෂාවන් සහ මෙම ව්‍යාපාරික අංශයේ අනාගත දිශානතිය අඛණ්ඩව ප්‍රතිනිර්මාණය කරනු ලබයි.

පෙර වසරට සාපේක්ෂව මෙම වසරේ ආදායමෙහි සුළු අඩුවීමක් දක්නට ලැබුණ ද, බලශක්ති ඉංජිනේරු සහ ගොඩනැඟිලි තාක්ෂණික විසඳුම් අංශය සිය සමස්ත කාර්යසාධනයේ කැපී පෙනෙන වර්ධනයක් අත්පත් කර ගැනීමට සමත් විය. මෙම ආදායම් වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් ආලෝකකරණ විසඳුම් මෙන්ම, අඩුම වෝල්ටීයතා සහ ගිනි නිවීමේ විසඳුම් අංශයන්ගෙන් ඉහළ දායකත්වයක් ලැබුණු අතර, අලුතින් ක්‍රියාත්මක කරන ලද සූර්ය බලශක්ති බලාගාර ද සමාගමේ ලාභදායීත්වයට සහ අනාගත පුනරාවර්තන ආදායමට සුවිශේෂී දායකත්වයක් ලබා දුන්නේය.

සලකා බලනු ලබන වසර තුළ, බලශක්ති ඉංජිනේරු අංශය විසින් මෙරට ප්‍රදේශ හයක අලුතින් ක්‍රියාත්මක කරන ලද සූර්ය බලශක්ති බලාගාර හයකින් ප්‍රතිලාභ ලැබීම ආරම්භ කළ අතර, එමඟින් ජාතික විදුලි බල පද්ධතියට මෙගාවොට් 25කට ආසන්න ධාරිතාවක් එක් කිරීමට හැකි විය. මෙම ව්‍යාපෘති මඟින් සමාගමට ස්ථාවර පුනරාවර්තන ආදායමක් උත්පාදනය කර දෙන අතරම, පිරිසිදු බලශක්තිය කරා ශ්‍රී ලංකාව ගෙන යන සංක්‍රමණයට ද මහඟු සහායක් ලබා දෙයි. මීට අමතරව, නැඟී එන විද්‍යුත් වාහන යටිතල පහසුකම් අවශ්‍යතා සපුරාලීම සඳහා මෙම අංශය මඟින් විද්‍යුත් වාහන ආරෝපණ ඒකක හඳුන්වා දුන් අතර, සමූහයේ ස්වයංක්‍රීය පහසුකම් යටතේ උත්පාදනය කරන ලද සූර්ය බලශක්තිය මඟින් ව්‍යාපාරයේ මෙහෙයුම් බලශක්ති පරිභෝජනය අඩු කර ගැනීමටත්, එහි අතිරික්ත ජනනය ජාතික විදුලි බල පද්ධතියට සැපයීමටත් කටයුතු කෙරුණි.

ආලෝකකරණ විසඳුම් අංශය විසින් තවත් ක්‍රිකට් ක්‍රීඩාංගණයක සර්ව දිශානතික ආලෝකකරණ ව්‍යාපෘතියක් සාර්ථකව නිම කරන ලද අතර, එමඟින් උසස් ආලෝකකරණ තාක්ෂණය සහ සුවිශේෂී ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් DIMO ආයතනය සතු ප්‍රමුඛස්ථානය නැවත වරක් තහවුරු විය. ගොඩනැඟිලි කළමනාකරණ පද්ධති, ගිනි නිවීමේ සහ ආලෝකකරණ විසඳුම් ඔස්සේ රටේ සන්ධිස්ථානීය සංවර්ධන ව්‍යාපෘති සඳහා ලබා දුන් දායකත්වය, මෙම ව්‍යාපාරික අංශය සතු පුළුල් ධාරිතාවය සහ හැකියාවන් මැනවින් ප්‍රදර්ශනය කරන්නකි.

2026/27 මූල්‍ය වර්ෂය දෙස බලන කල, මෙම අංශය සියලුම ක්ෂේත්‍රයන් පුරා වර්ධනයක් අත්පත් කර ගැනීමටත්, කර්මාන්තයේ තාක්ෂණික දියුණුවට මෙන්ම සමූහයේ වර්ධන හා තිරසාරත්ව අරමුණු සාක්ෂාත් කර ගැනීමටත් දායක වීමට මනා සූදානමකින් පසුවෙයි.

## යටිතල පහසුකම් ඉංජිනේරු ක්ෂේත්‍රය

යටිතල පහසුකම් ඉංජිනේරු ව්‍යාපාරික අංශය, පසුගිය කාල පරිච්ඡේදය පුරා පැවති මන්දගාමී කාර්යසාධනයෙන් පසුව මෙම වසරට අවතීර්ණ වූ අතර, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ ඇති වූ ක්‍රමෝපායික ප්‍රකෘතිමත් වීමෙන් එය බෙහෙවින් ප්‍රතිලාභ ලැබීය. ඒ අනුව, යළි ආරම්භ වූ යටිතල පහසුකම්, පොදු උපයෝගිතා සහ ඉදිකිරීම් ආශ්‍රිත ක්‍රියාකාරකම් මධ්‍යයේ මෙම අංශය සිය වර්ධන වේගය නැවත අත්පත් කර ගැනීමට සමත් විය.

දේශීය ඉල්ලුම වර්ධනය වීමත් සමඟ, ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර අලෙවි ව්‍යාපාරය මේ සඳහා කැපී පෙනෙන දායකත්වයක් ලබා දුන්නේය. බංග්ලාදේශයේ පැවති තරඟකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියක් හරහා විශාල ඇණවුමක් ලබා ගැනීමට හැකි වීම, අපගේ කලාපීය පැවැත්ම තවදුරටත් ශක්තිමත් කළ අතර, ශ්‍රී ලංකාවෙන් ඔබ්බට ගොස් තාක්ෂණික ධාරිතාවය, ජාත්‍යන්තර මව් සමාගම් සමඟ ඇති සබඳතා සහ වෙළඳපොළ පිළිබඳ ඇති සූක්ෂ්ම අවබෝධය මැනවින් භාවිත කිරීමට මෙම අංශයට ඇති හැකියාව එමඟින් මනාව පිළිබිඹු විය.

ඉදිකිරීම් යන්ත්‍ර සූත්‍ර සඳහා වන අලෙවියෙන් පසු සේවා ක්ෂේත්‍රයේ දී, අපගේ දිගුකාලීන පාරිභෝගිකයෙකු සමඟ එළඹුණු 'සම්පූර්ණ නඩත්තු ගිවිසුම' සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කළේය. එමඟින් යන්ත්‍ර සූත්‍රවල සමස්ත ජීවන චක්‍රය සඳහාම සහාය වීමේ අපගේ ව්‍යාපාරික ආකෘතිය මෙන්ම, යන්ත්‍ර සූත්‍ර අඛණ්ඩව ක්‍රියාත්මක කර තැබීම, විශ්වාසනීයත්වය සහ ගුණාත්මක සේවාව වෙනුවෙන් පාරිභෝගිකයින් අප කෙරෙහි තබා ඇති විශ්වාසය තවදුරටත් තහවුරු විය.

ද්‍රව සහ ජල කළමනාකරණ විසඳුම් අංශය, යාපනය-කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය ඔස්සේ සිය වර්ධන වේගය අඛණ්ඩව පවත්වා ගෙන ගියේය. සුරක්ෂිත ජල සම්පාදනය, සනීපාරක්ෂාව, දේශගුණික ඔරොත්තු දීමේ හැකියාව සහ පොදු උපයෝගිතා පද්ධති නවීකරණය කිරීම වැනි ජාතික ප්‍රමුඛතාවන් මත පදනම් වෙමින් මෙම අංශයේ දිගුකාලීන අනාගත අපේක්ෂාවන් තවදුරටත් ශක්තිමත් වී ඇත.

අනාගතය දෙස බලන කල, ඉලක්කගත වර්ධන උපායමාර්ගයක් සහ භූගෝලීය සීමාවන්ගෙන් ඔබ්බට ව්‍යාපාරය ව්‍යාප්ත කිරීමේ කැපවීම සමඟින්, සමූහයේ සමස්ත වර්ධන සැලසුම් සඳහා අර්ථවත් දායකත්වයක් ලබා දීමට මෙම ව්‍යාපාරික අංශය මනා සූදානමකින් පසුවෙයි.

## සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය

සලකා බලනු ලබන වසර තුළ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රය, මධ්‍යස්ථ වර්ධනයක් වාර්තා කළද, එය ජාතික දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගයට වඩා අඩු මට්ටමක පැවතුණි. විශේෂයෙන්ම, රජයේ සෞඛ්‍ය සේවා වියදම් සහ ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් මෙම ක්ෂේත්‍රය තුළ ව්‍යාපාරික අවස්ථාවන් සාර්ථක කර ගැනීමේ වේගය සහ කාලීනභාවය කෙරෙහි දිගින් දිගටම බලපෑම් එල්ල කළ බැවින්, වෙළඳපොළ අවස්ථා සීමිත මට්ටමක පැවතුණි.

මෙවැනි පසුබිමක වුවද, අභියෝගාත්මක මෙහෙයුම් වටපිටාවකට සාර්ථකව මුහුණ දෙමින් සෞඛ්‍ය සේවා ව්‍යාපාරික අංශය ස්ථාවර ඔරොත්තු දීමේ හැකියාවක් ප්‍රදර්ශනය කළ අතර, එහි ප්‍රාග්ධන උපකරණ සහ ඖෂධ යන අංශ ද්විත්වයෙහිම මැනිය හැකි වර්ධනයක් වාර්තා කිරීමට සමත් විය. නේත්‍ර රෝග ආශ්‍රිත නිෂ්පාදන සමූහයේ කාර්යසාධනය සඳහා සාධනීය දායකත්වයක් ලබා දුන් අතර, අක්ෂි කාච නිෂ්පාදන මාලාවේ ඇති වූ ප්‍රගතිය අනාගත වර්ධනය සඳහා දිරිගන්වනසුලු පෙරනිමිති පළ කළේය.

කෙසේ වෙතත්, අපගේ උපායමාර්ගික ක්‍රියාකාරීත්වය තවදුරටත් තියුණු කළ යුතු බවත්, ඉහළ ඉල්ලුමක්, වැඩි ප්‍රතිලාභ සහ දිගුකාලීන වැදගත්කමක් ඇති ක්ෂේත්‍ර වෙත අපගේ ධාරිතාවයන් යොමු කළ යුතු බවත් අප හඳුනාගෙන ඇත්තෙමු. මෙම ව්‍යාපාරික අංශය ඖෂධ සහ පරිභෝජන ද්‍රව්‍යවලින් ඔබ්බට ගොස් උසස් වෛද්‍ය තාක්ෂණය සහ ප්‍රාග්ධන උපකරණ ක්ෂේත්‍රය කරා ක්‍රමයෙන් ව්‍යාප්ත වීම, ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ දිනෙන් දින වෙනස්වන අවශ්‍යතා සපුරාලීම සඳහා පුළුල් වේදිකාවක් සපයයි.

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ දෘෂ්ටිකෝණය / ඉදිරි දැක්ම

2026/27 මූල්‍ය වර්ෂයට අවතීර්ණ වන විට, සෞඛ්‍ය සේවා අංශය වඩාත් ඉලක්කගත වර්ධන උපායමාර්ගයක් සමඟින් සිය ගමන් මඟ ආරම්භ කරයි. එහිදී අපගේ ප්‍රමුඛතාවය වනුයේ කෙටිකාලීනව ඉහළ ඉල්ලුමක් පවතින බව තහවුරු වී ඇති ක්ෂේත්‍ර තවදුරටත් ශක්තිමත් කරන අතරම, දිගුකාලීන වර්ධනයට සහාය වන සැලසුම් අඛණ්ඩව ක්‍රියාවට නැංවීමයි. මෙම ප්‍රවේශය තුළින් රටේ සෞඛ්‍ය සේවා ක්ෂේත්‍රයේ දියුණුවට මෙන්ම සමූහයේ පුළුල් වටිනාකම් නිර්මාණය කිරීමේ සැලැස්මට වඩාත් අර්ථවත් දායකත්වයක් ලබා දීමට අපි අදහස් කරමු.

## සිල්ලර වෙළඳාම් ක්ෂේත්‍රය

සාර්ව ආර්ථික ස්ථාවරත්වය වර්ධනය වීම, ණය පහසුකම් ලිහිල් වීම සහ වාහන ආනයනය නැවත ආරම්භ කිරීම වැනි සාධනීය ලකුණු හේතුවෙන්, සිල්ලර වෙළඳාම් ව්‍යාපාරික අංශය ක්‍රමයෙන් ප්‍රකෘතිමත් වන වෙළඳපොළක් තුළ ක්‍රියාත්මක විය. කෙසේ වෙතත්, පාරිභෝගිකයින්ට භාණ්ඩ මිලදී ගැනීමට ඇති හැකියාව කෙරෙහි එල්ල වූ පීඩනය, ආනයන පිරිවැය, බදු පැනවීම් සහ අත්‍යවශ්‍ය නොවන දෑ සඳහා වියදම් කිරීම පාරිභෝගිකයින් පාලනයකින් යුතුව සිදු කිරීම හේතුවෙන්, රථවාහන අමතර කොටස්, ටයර්, ගෘහ විදුලි උපකරණ සහ බලශක්ති මෙවලම් සඳහා වූ ඉල්ලුමේ වර්ධනය ඒකාකාරී නොවන ස්වභාවයක් ගත්තේය.

වෙළඳපොළ තත්ත්වයන් යහපත් අතට හැරුණ ද, මිල ගණන් පිළිබඳව දැඩි සේ සැලකිලිමත් වන පාරිභෝගික හැසිරීම් සහ පවුල් ඒකකවල සීමිත භාණ්ඩ මිලදී ගැනීමේ හැකියාව (ක්‍රය ශක්තිය) හේතුවෙන් මෙම අංශයේ සමස්ත කාර්යසාධනය පැවතියේ පාලනයකින් යුතු මට්ටමකය. එහිදී, වාහන නඩත්තු අවශ්‍යතා, අමතර කොටස් ප්‍රතිස්ථාපනය සඳහා වූ ඉල්ලුම සහ නැවත ප්‍රාණවත් වූ රථවාහන ආශ්‍රිත ක්‍රියාකාරකම්වල දායකත්වයෙන්, රථවාහන අමතර කොටස් අංශය මෙම ව්‍යාපාරික ක්ෂේත්‍රයේ ප්‍රධානම ආදායම් උපයන්නා ලෙස අඛණ්ඩව පෙරමුණ ගත්තේය. එමෙන්ම, නැවත ආරම්භ වූ ඉදිකිරීම්, ප්‍රතිසංස්කරණ, වැඩපොළ සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය ක්‍රියාකාරකම් හේතුවෙන්, බලශක්ති මෙවලම් ව්‍යාපාරය දිරිගන්වනසුලු අලෙවි වර්ධනයක් වාර්තා කළ අතර, එමඟින් එහි අනාගත වර්ධන විභවතාවය මැනවින් පෙන්නුම් කළේය. කෙසේ වෙතත්, පාරිභෝගිකයින් අත්‍යවශ්‍ය නොවන දෑ සඳහා වියදම් කිරීමේදී දිගින් දිගටම ප්‍රවේශම්කාරී පිළිවෙතක් අනුගමනය කිරීම නිසා, තෝරාගත් ගෘහ විදුලි උපකරණ සහ අනෙකුත් සමහර නිෂ්පාදන පෙළෙහි අලෙවිය අපේක්ෂිත මට්ටමට වඩා අඩු අගයක පැවතුණි.

මෙම තත්ත්වයට සාර්ථකව මුහුණ දීම සඳහා, නිෂ්පාදන එකතුව ප්‍රතිසංවිධානය කිරීම, වඩාත් තියුණු බෙදාහැරීමේ නාලිකා කළමනාකරණය, තොග තත්ත්වයන් ප්‍රශස්ත කිරීම සහ කාරක ප්‍රාග්ධන කාර්යක්ෂමතාවය ඔස්සේ වර්ධනය නැවත ළඟා කර ගැනීමේ ඉලක්කගත උපායමාර්ගයක් සමඟින් මෙම අංශය නව මූල්‍ය වර්ෂයට අවතීර්ණ වෙයි.

මෙම ප්‍රමුඛතාවන්, ඉදිරි වසර තුළ සිල්ලර වෙළඳාම් අංශයේ කාර්යසාධනය ඉහළ නැංවීමට සහ වඩාත් ශක්තිමත් ප්‍රතිඵල අත්පත් කර දීමට මනා පිටුවහලක් වනු ඇත.

## මෙහෙයුම් විශිෂ්ටත්වය තවදුරටත් තියුණු කිරීම

අපගේ 2025/26 කාර්යසාධනය දෙස ආපසු හැරී බැලීමේ දී, අනාගත වර්ධනය උපායමාර්ගික ව්‍යාප්තියකින් පමණක් නොව, වඩාත් තියුණු මෙහෙයුම් විනයක් මඟින් ද අනිවාර්යයෙන්ම බලගැන්විය යුතු බව අප පිළිගනිමු. සලකා බලනු ලබන වසර අපගේ ආර්ථික පිබිදීමේ සහ වර්ධන ප්‍රමුඛතාවන්හි ශක්තිමත්භාවය මැනවින් තහවුරු කළ ද, කාර්යසාධනය අඛණ්ඩව පවත්වා ගැනීමට සහ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැඟීම සඳහා වඩාත් අවධානය යොමු කළ යුතු ක්ෂේත්‍ර ද එමඟින් මතු කර පෙන්වීය.

ඒ අනුව, 2026/27 මූල්‍ය වර්ෂය සඳහා වන අපගේ මෙහෙයුම් ප්‍රමුඛතාවන් වඩාත් ශක්තිමත් මුදල් ප්‍රවාහ කළමනාකරණයක්, විනයගරුක කාරක ප්‍රාග්ධන පාලනයක්, ලාභ ආන්තිකයන් ප්‍රශස්ත කිරීම, නිෂ්පාදන එකතුව ප්‍රතිසංවිධානය කිරීම සහ උසස් දත්ත විශ්ලේෂණය හරහා කාර්යසාධනය අධීක්ෂණය කිරීම ඉහළ නැංවීම කෙරෙහි කේන්ද්‍රගත වනු ඇත. නව මුලපිරීම් සහ ආයෝජනවලින් අපේක්ෂිත ප්‍රතිලාභ, ඒවායේ උපායමාර්ගික වැදගත්කම සහ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය වඩාත් විනයගරුකව සමාලෝචනය වන බව සහතික කරමින්, ඒවා සමීපව අධීක්ෂණය කිරීම කෙරෙහි ද ප්‍රධාන අවධානයක් යොමු කෙරේ.

තෝරාගත් ව්‍යාපාරයන් පුරා දැනටමත් ආරම්භ කර ඇති ව්‍යුහාත්මක වෙනස්කම් සම්පූර්ණ කිරීමටත්, එම මෙහෙයුම් ආකෘතීන්ගෙන් අපේක්ෂිත ප්‍රතිලාභ උපරිම කර ගැනීමටත් අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. මෙම ප්‍රමුඛතාවන් ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීම සඳහා, පැහැදිලි වගවීමක් සහ මැනිය හැකි ඉලක්ක සහිතව කැපවූ කණ්ඩායම් වෙත අවශ්‍ය බලතල පවරා දෙනු ඇත.

මෙවැනි ශක්තිමත් මෙහෙයුම් ක්‍රමවේදයක් ඔස්සේ, අපගේ උපායමාර්ගික අභිප්‍රායන් 2026/27 මූල්‍ය වර්ෂය තුළ වඩාත් ස්ථාවර සහ තිරසාර කාර්යසාධනයක් බවට පරිවර්තනය කර ගැනීමට මෙම ප්‍රමුඛතාවන් සමූහයට මනා පිටුවහලක් වනු ඇතැයි අප තුළ නොසැලෙන විශ්වාසයක් පවතියි.

## ඩිජිටල් පරිවර්තනය: අනාගත වර්ධනය උදෙසා පදනම ශක්තිමත් කිරීම

පසුගිය වසරේ දී පිහිටුවන ලද විශේෂිත කණ්ඩායම් විසින් මෙහෙයවනු ලැබූ නව ERP පද්ධතිය සහ ඩිජිටල්කරණ මුලපිරීම් ක්‍රියාවට නැංවීමත් සමඟ, අපගේ ඩිජිටල් පරිවර්තන ප්‍රවේශය වඩාත් ව්‍යුහාත්මක මෙන්ම උපායමාර්ගික දිශානතියක් ගෙන ඇත. ඩිජිටල් තාක්ෂණය යනු ව්‍යාපාරික කාර්යක්ෂමතාවය ඉහළ නැංවීමේ මෙවලමක් පමණක්ම නොව, තීරණ ගැනීම තියුණු කරන, පාර්ශවකරුවන්ගේ අත්දැකීම් වැඩිදියුණු කරන සහ තිරසාර වර්ධනයට සහාය වන ප්‍රධාන ආයතනික ධාරිතාවක් ලෙස අප දැන් සලකනු ලබයි.

අපගේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ උපායමාර්ගය ප්‍රධාන ප්‍රමුඛතාවන් කිහිපයක් වටා ගොඩනැඟී ඇත. එනම්, ඩිජිටල් පදනම ශක්තිමත් කිරීම, පාරිභෝගික සහ සේවක අත්දැකීම් වඩාත් අර්ථවත් කිරීම, ස්වයංක්‍රීයකරණය සහ කෘත්‍රිම බුද්ධිය ඉදිරියට රැගෙන යාම, අභ්‍යන්තර මෙහෙයුම් සහ ක්‍රියාවලීන්හි කාර්යක්ෂමතාවය නැංවීම, ආයතනික දත්ත විශ්ලේෂණ ධාරිතාවය ගොඩනැඟීම මෙන්ම පද්ධති සහ දත්ත ආරක්ෂණය ශක්තිමත් කිරීමයි. දිගුකාලීන අනුගත වීම සහ වටිනාකම් නිර්මාණය කිරීම සහතික කරනු පිණිස, මෙම ප්‍රමුඛතාවන් අදියරෙන් අදියර සහ විනයගරුක අයුරින් ආයතනික ව්‍යුහය තුළ ස්ථාපිත වෙමින් පවතියි.

සලකා බලනු ලබන වසර තුළ, අප විසින් SAP ERP පද්ධතියේ දෙවන අදියර සාර්ථකව ආරම්භ කළ අතර, එය දැනට ක්‍රියාත්මක වෙමින් පවතියි. මෙම අදියර මඟින් SAP Analytics Cloud තාක්ෂණය හඳුන්වා දෙන අතර, එමඟින් වඩාත් ව්‍යුහාත්මක සහ ස්වයංක්‍රීය සැලසුම්කරණයක්, නිරීක්ෂණයක්, ව්‍යාපාරික බුද්ධියක් සහ දත්ත විශ්ලේෂණයක් සිදු කිරීමට අවස්ථාව සැලසේ. මීට අමතරව, මෙහෙයුම් කඩිනම්භාවය සහ සේවා සැපයීම ඉහළ නැංවීමේ අරමුණින්, පාරිභෝගිකයින් සඳහා වන මෙන්ම ක්ෂේත්‍ර නිලධාරීන් ඉලක්ක කරගත් ජංගම දුරකථන යෙදවුම් සහ හඳුනාගත් ඩිජිටල් වැඩිදියුණු කිරීම් රැසක් ද මෙම අදියරට ඇතුළත් වේ.

ERP පද්ධතියට අමතරව, අපගේ විශේෂිත ඩිජිටල්කරණ කණ්ඩායම විසින් ප්‍රධාන පද්ධතිය සමඟ බද්ධ වූ, පිරිවැය-කාර්යක්ෂම සහ කෘත්‍රිම බුද්ධිය උපයෝගී කරගත් විසඳුම් අඛණ්ඩව ඉදිරියට රැගෙන යන ලදී. මෙම මුලපිරීම් සැලසුම් කර ඇත්තේ ප්‍රායෝගික ව්‍යාපාරික අවශ්‍යතා සපුරාලීමට, ක්‍රියාවලීන්හි ප්‍රතිචාර දැක්වීමේ වේගය ඉහළ නැංවීමට, දත්ත මත පදනම් වූ අවබෝධයන් ලබා ගැනීමට සහ සමූහය පුරා තිරසාර පාරිභෝගික වටිනාකම් ප්‍රදර්ශනය කිරීමටයි.

මෙම ප්‍රයත්නයන් හරහා, නැඟී එන ඩිජිටල් අවස්ථාවන් නිරවද්‍යතාවයෙන් යුතුව භාවිත කළ හැකි, අප ක්‍රියාත්මක වන සාම්ප්‍රදායික සීමාවන් බිඳ දමන සහ පාර්ශවකරුවන් සඳහා ඉහළ වටිනාකම් නිර්මාණය කරන අනාගතයට සූදානම් සංවිධානයක් සඳහා අපි අඩිතාලම දමමින් සිටින්නෙමු. වර්ධනය වන තාක්ෂණය මත පදනම් වූ ව්‍යාපාරික වටපිටාවක් තුළ ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැඟීමට, ඵලදායීතාවය ඉහළ නැංවීමට සහ තිරසාර වර්ධනයට සහාය වීමට අපට ඉඩ සලසමින්, ඩිජිටල් පරිවර්තනය අපගේ දිගුකාලීන උපායමාර්ගයේ කේන්ද්‍රීය සාධකයක් ලෙස අඛණ්ඩව පවතියි.

## අපගේ මානව සම්පත, අපගේ සුවිශේෂී තරඟකාරී ශක්තිය

අපගේ සේවකයින් එක් එක් පාරිභෝගික ගනුදෙනුවලට දායක කරන විශේෂඥ දැනුම, වෘත්තීයභාවය සහ කැපවීම, වෙළඳපොළ තුළ අප සතු සුවිශේෂී තරඟකාරී ශක්තිය මැනවින් හැඩගස්වයි. පාරිභෝගිකයින්, ජාත්‍යන්තර මව් සමාගම් සහ ව්‍යාපාරික හවුල්කරුවන් සමඟ අප ගොඩනඟා ගන්නා විශ්වාසයට මෙන්ම, අප ලබා දීමට උත්සාහ කරන උසස් සේවා ප්‍රමිතියට ද ඔවුන්ගේ දායකත්වය කේන්ද්‍රීය සාධකයක් වෙයි.

ආයතනික ධාරිතාවය ගොඩනැඟීම, සේවක බලගැන්වීම, සම්බන්ධීකරණය සහ සමූහයේ අරමුණ මෙන්ම දිගුකාලීන උපායමාර්ගය සමඟ ඔවුන්ව පෙළගැස්වීම අරමුණු කරගත්, උපායමාර්ගික මානව ප්‍රාග්ධන මූලපිරීම් ඔස්සේ අපගේ මෙම තරඟකාරී වාසිය අපි අඛණ්ඩව ශක්තිමත් කරන්නෙමු. අපගේ වැඩසටහන් මඟින් අඛණ්ඩ අධ්‍යාපනය, නැඟී එන වෙළඳපොළ අවශ්‍යතාවලට ගැළපෙන සේ කුසලතා වර්ධනය කිරීම සහ අඛණ්ඩ ඉගෙනුම් සංස්කෘතියක් ආයතනය තුළ නිර්මාණය කිරීම සඳහා සහාය ලබා දෙයි.

රටේ විරැකියාව අවම කිරීම සඳහා ලබා දුන් දායකත්වය *

**0.5%**

DIMO සමූහයේ ශුද්ධ රැකියා නියුක්ති වර්ධන අනුපාතිකය

**12%**

* මූලාශ්‍රය: ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික ආර්ථික විලෝකනය 2025 – ප්‍රධාන ආර්ථික දර්ශක; ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ශ්‍රම බලකා සමීක්ෂණය මත පදනම් වේ.

සලකා බලනු ලබන වසර තුළ, අපගේ ප්‍රධාන අවධානය තාක්ෂණික හා මෘදු කුසලතා, සෞඛ්‍ය හා ආරක්ෂාව, තිරසාරත්වය, අවදානම් කළමනාකරණය, අනුකූලතා ප්‍රමිතීන් මෙන්ම, ආත්මවිශ්වාසයෙන් යුත්, දක්ෂ සහ අනාගතයට සූදානම් කණ්ඩායම් ගොඩනැඟීමට අත්‍යවශ්‍ය වන අනෙකුත් සියලුම ක්ෂේත්‍ර වෙත යොමු විය. එසේම, සෑම සේවකයෙකුටම තමන් වටිනා අයෙකු බව හැඟෙන සහ සිය උපරිම දක්ෂතාවය ප්‍රදර්ශනය කිරීමට බලය ලැබෙන, විවිධාංගීකරණය, සියල්ල අන්තර්ගත සහ අන්‍යෝන්‍ය ගෞරවය මත පදනම් වූ සේවා ස්ථාන සංස්කෘතියක් පෝෂණය කිරීමට අපි නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු.

මානව ප්‍රාග්ධන සංවර්ධනය යනු අපගේ දිගුකාලීන පරිවර්තන සැලැස්මේ ප්‍රධාන අංගයකි. අප ඉදිරියට යන විට, අපගේ සේවකයින් වෙනුවෙන් ආයෝජනය කිරීමටත්, නායකත්ව සහ විශේෂඥ ධාරිතාවයන් ශක්තිමත් කිරීමටත්, සමූහයේ වර්ධනය, ඔරොත්තු දීමේ හැකියාව සහ දිගුකාලීන අගය නිර්මාණය කිරීම සඳහා සහාය වන කඩිනමින් හැඩගැසිය හැකි ශ්‍රම බලකායක් ගොඩනැඟීමටත් අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු.

## තිරසාරත්වය ක්‍රියාවෙන් සනාථ කිරීම

අපගේ උපායමාර්ගික ප්‍රමුඛතාවන්ට අනුකූලව, පාරිසරික, සමාජීය සහ ආයතනික පාලන සාධක අපගේ ව්‍යාපාරික ආකෘතියට බද්ධ කරමින්, අපගේ තිරසාරත්ව සැලැස්ම ඉදිරියට රැගෙන යාමට අපි අඛණ්ඩව කටයුතු කරන්නෙමු. අපගේ '2030 තිරසාරත්ව න්‍යාය පත්‍රය' මඟින් වගකීම්සහගත මූල්‍ය වර්ධනයක් පවත්වා ගන්නා අතරම, ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් ඔස්සේ අපගේ දිගුකාලීන දැක්ම සහ ඉලක්ක සලකුණු කර ඇත. එනම්, තිරසාර ව්‍යාපාර වර්ධනය කිරීම, සේවක හා ප්‍රජා දායකත්වය ශක්තිමත් කිරීම මෙන්ම පරිසරය පෝෂණය කිරීම සහ සුරැකීමයි.

තිරසාරත්වය සැබවින්ම අර්ථවත් වන්නේ එය මිනිසුන් විසින් වටහාගෙන, වැළඳගෙන සහ ජීවිතයට බද්ධ කරගත් විට පමණක් බව අපි විශ්වාස කරමු. ඒ අනුව, අපගේ ප්‍රයත්නයන් සේවක සහභාගීත්වය සහ දැනුවත්භාවය තුළින් ප්‍රථමයෙන් සංවිධානය තුළින්ම ආරම්භ වන අතර, පසුව එය අප සේවය කරන පාරිභෝගිකයින්, ප්‍රජාවන් සහ සමස්ත සමාජය වෙත ව්‍යාප්ත වෙයි.

සලකා බලනු ලබන වර්ෂය තුළ, අපගේ මූලපිරීම් මඟින් විවිධ ක්ෂේත්‍ර ඔස්සේ දැනුවත්භාවය සහ ක්‍රියාකාරීත්වය අඛණ්ඩව ප්‍රවර්ධනය කරන ලද අතර, තිරසාරත්ව සංකල්පය සක්‍රීය සේවක දායකත්වයක් බවට පරිවර්තනය කිරීමට ද සමත් විය. DIMO Nature Club හරහා අපි සේවකයින් අතර පාරිසරික හා වනජීවී අධ්‍යාපනය දිරිගැන්වූ අතර, එමඟින් සොබාදහම පිළිබඳ ගැඹුරු ඇගයීමක් සහ වගකීම්සහගත භාරකාරත්වයක් ඔවුන් තුළ නිර්මාණය කළෙමු. මෙම ප්‍රයත්නයන් පාරිසරික හා කුසලතා සංවර්ධන අධ්‍යාපන වැඩසටහන් මෙන්ම පැළ බෙදා හැරීමේ මූලපිරීම් ඔස්සේ පාසල් දරුවන් සහ ප්‍රජාවන් වෙත ද තවදුරටත් ව්‍යාප්ත කරන ලදී.

එමෙන්ම, අපගේ Operation 8 ස්වේච්ඡා සේවා වැඩසටහන හරහා, සේවකයින්ට ඔවුන්ගේ නිල රාජකාරිවලින් ඔබ්බට ගොස් ප්‍රජා සේවය සඳහා අර්ථවත් ලෙස දායක වීමට දිරිගන්වමින්, සමාජ වගකීම් පිළිබඳ සංස්කෘතියක් ආයතනය තුළ ශක්තිමත් කිරීමට අපි අඛණ්ඩව කටයුතු කළෙමු. තිරසාරත්වය යනු හුදෙක් ප්‍රතිපත්ති, ඉලක්ක හෝ වාර්තාකරණ රාමුවලට පමණක් සීමා වූවක් නොවන බවත්, එය සංස්කෘතිය, හැසිරීම සහ පොදු වගකීමක් ලෙස ජීවිතයට බද්ධ කරගත යුත්තක් බවත් අපගේ මෙම මූලපිරීම්වලින් මැනවින් පිළිබිඹු වේ.

දේශගුණික අවදානමෙහි වර්ධනය වන බරපතලකම හඳුනා ගනිමින්, දේශගුණික අභියෝගයන්ට කඩිනමින් සහ පැහැදිලි අරමුණක් සහිතව මුහුණ දීම තුළින් වගකීම්සහගත ආයතනික පුරවැසියෙකු ලෙස අපගේ භූමිකාව අපි නැවත වරක් ස්ථාවර කරමු. මෙම වසරේ වාර්තාව මඟින් අපගේ ප්‍රධාන ESG කාර්යසාධන දර්ශක සහ ප්‍රගතිය ඉදිරිපත් කර ඇති අතර, එමඟින් අපගේ ව්‍යාපාරය, පාර්ශවකරුවන්, පරිසරය සහ සමස්ත දේශය වෙනුවෙන් දිගුකාලීන අගයක් නිර්මාණය කිරීමට අප සතු කැපවීම මනාව ප්‍රදර්ශනය වේ.

## ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය සහ වගකීම්සහගත භාරකාරත්වය

අපගේ ආයතනික අරමුණ සහ සන්නාම ප්‍රතිඥාව, ආයතනික පාලනය මෙන්ම අවදානම් සහ අවස්ථා කළමනාකරණය පිළිබඳ ශක්තිමත් ව්‍යුහයක් තුළ අඛණ්ඩව ඉදිරියට රැගෙන යනු ලබයි. මෙම ව්‍යුහයන් විසින් ආයතනික පාලනය, තොරතුරු තාක්ෂණ හා සයිබර් ආරක්ෂණ පාලනය සහ අවදානම් පාලනය යන සියල්ල එකට බද්ධ කරනු ලබන අතර, එමඟින් අපගේ ව්‍යාපාරික කටයුතු පැහැදිලි ව්‍යුහයක්, විනයක්, වගවීමක් සහ නිසි අධීක්ෂණයක් සහිතව සිදු වන බව සහතික කෙරේ.

සලකා බලනු ලබන වර්ෂය තුළ, පවතින අවිනිශ්චිතතාවලට පූර්ව සූදානමකින් යුතුව මුහුණ දීම සඳහා සහ උපායමාර්ගික තීරණ ගැනීමේ ක්‍රියාවලියට තිරසාරත්ව සාධක බද්ධ කිරීම සඳහා, අපගේ අවදානම් සහ අවස්ථා කළමනාකරණ පද්ධති අපි තවදුරටත් ශක්තිමත් කළෙමු. එහිදී, තිරසාරත්වය සහ දේශගුණයට අදාළ අවදානම් කෙරෙහි වැඩි බරක් තබමින්, අවදානම් කළමනාකරණ ව්‍යුහය ඉහළ නැංවීම කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කරන ලදී. මෙයට අවදානම් ප්‍රතිපත්තිය සමාලෝචනය කිරීම, අවදානම් පාලනය ශක්තිමත් කිරීම, අවදානම් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමක් හඳුන්වා දීම සහ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වඩාත් ක්‍රමවත් කිරීම ඇතුළත් විය.

අපගේ ආයතනික වටිනාකම්, සමස්ත සංවිධානය පුරා පාරිභෝගික හා සේවක හැසිරීම් මෙහෙයවනු ලබන ප්‍රතිපත්ති, භාවිතයන් සහ ප්‍රමිතීන් තුළින් මැනවින් පිළිබිඹු වේ. ආයතනික පාලනය යනු සමූහය විසින් සැමවිටම ඉහළම ප්‍රමුඛතාවක් ලබා දෙන ක්ෂේත්‍රයකි. සලකා බලනු ලබන වසර තුළ, නොදැනුවත්කම නිසා සිදු වූ එක් අනුකූල නොවීමක් වාර්තා වූ අතර, ඒ සඳහා අදාළ බලධාරීන් සමඟ සාකච්ඡා කර වහාම නිවැරදි කිරීමේ පියවර ගන්නා ලදී. එම තත්ත්වය මෙම වාර්තාවේ 'ආයතනික පාලනය' පිළිබඳ පරිච්ඡේදය යටතේ විවෘතව අනාවරණය කර ඇත.

අපගේ දීර්ඝ ඉතිහාසය පුරා ගොඩනඟා ගත් විශ්වාසය සහ අඛණ්ඩතාවයේ උරුමය ඉදිරියටම රැගෙන යමින්, ආයතනික පාලනය, විනිවිදභාවය සහ වගවීමේ ඉහළම ප්‍රමිතීන් සුරැකීමට අපි නිරන්තරයෙන් කැපවී සිටින්නෙමු.

# ප්‍රධාන විධායක නිලධාරීවරයාගේ දෘෂ්ටිකෝණය / ඉදිරි දැක්ම

## සහතිකකරණය, විනිවිදභාවය සහ විශ්වසනීයත්වය

DIMO ආයතනය තුළ, විනිවිදභාවය යනු අපගේ පාර්ශවකරුවන් වෙනුවෙන් ඉටුකළ යුතු මූලිකම වගකීමකි. සදාචාරාත්මක හැසිරීම, වගවීම සහ තොරතුරු අනාවරණය කිරීමේ ඉහළම ප්‍රමිතීන් මඟින් මෙහෙයවනු ලබන අප, අපගේ ආයතනික වාර්තාකරණය හරහා ඉදිරිපත් කරන තොරතුරු විශ්වසනීය, සමබර සහ පූර්ණ තත්ත්වයෙන් යුක්ත බව සහතික කිරීම සඳහා කැපවී සිටින්නෙමු. මෙම ඒකාබද්ධ වාර්ෂික වාර්තාව එම කැපවීම මැනවින් පිළිබිඹු කරන්නක් වන අතර, එමඟින් අපගේ කාර්යසාධනය, ආයතනික පාලනය, උපායමාර්ග සහ වටිනාකම් නිර්මාණය කිරීමේ ගමන් මඟ පිළිබඳ පැහැදිලි මෙන්ම විශ්වාසදායක විස්තරයක් සපයයි.

අපගේ ව්‍යවස්ථාපිත ස්වාධීන විගණකවරුන් විසින් ලබා දෙනු ලබන සහතිකකරණයට අමතරව, මෙම වාර්තාවේ වාර්තාකරණ වටපිටාව යන කොටසෙහි දක්වා ඇති පරිදි, තෝරාගත් තොරතුරු අනාවරණයන් සඳහා අපි බාහිර පාර්ශවීය සහතිකකරණයන් ද ලබාගෙන ඇත්තෙමු.

මෙම ප්‍රවේශය ඔස්සේ පාර්ශවකරුවන්ගේ විශ්වාසය තවදුරටත් ශක්තිමත් කිරීමටත්, වාර්තාකරණයේ ගුණාත්මකභාවය ඉහළින්ම සුරැකීමටත්, වගකීම්සහගත ආයතනික භාරකරුවෙකු ලෙස අප කෙරෙහි තබා ඇති විශ්වාසය තහවුරු කිරීමටත් අපි බලාපොරොත්තු වෙමු.

## නිරවද්‍යතාවයෙන් යුතුව ඉදිරියටම: බාධක බිඳ දැමීම

අප 2026/27 මූල්‍ය වර්ෂයට අවතීර්ණ වන විට, අපගේ ප්‍රධාන අවධානය යොමු වී ඇත්තේ පැහැදිලි බව, විනය සහ නිරවද්‍යතාවය පෙරදැරි කරගනිමින් අපගේ උපායමාර්ගික මාර්ගසිතියම වඩාත් වේගවත් කිරීම කෙරෙහි ය. අපගේ ආයතනික අරමුණ, සන්නාම ප්‍රතිඥාව, උපායමාර්ගික කුළුණු සහ ප්‍රමුඛතාවන් මත පදනම් වෙමින් වෙළඳපොළ සංවර්ධනය තියුණු කිරීමටත්, ඩිජිටල්කරණය ඉදිරියට රැගෙන යාමටත්, මූල්‍ය විනය ශක්තිමත් කිරීමටත්, දක්ෂතා හා සංස්කෘතික පරිවර්තනයක් ඇති කිරීමටත් මෙන්ම සමූහය පුරා නවෝත්පාදනයන් දිරිගැන්වීමටත් හැකි වන පරිදි අපගේ මූලික ආයතනික ක්‍රියාකාරීත්වයන් අපි නැවත පෙළගස්වමින් සිටින්නෙමු.

තිරසාරත්වය, ආයතනික පාලනය, අවදානම් කළමනාකරණය, ඩිජිටල් පරිවර්තනය සහ ප්‍රාග්ධනය ප්‍රශස්ත කිරීම යන ක්ෂේත්‍ර ඔස්සේ මෙම වසර තුළ අප ගොඩනඟා ඇති ශක්තිමත් පදනම, අපට ඉදිරියට යාම සඳහා අවශ්‍ය සාධනීය වේදිකාව සපයයි. ඒකාබද්ධ භාරකාරත්වය සඳහා අප සතු කැපවීම මඟින් අපගේ උපායමාර්ග, ප්‍රාග්ධන වෙන්කිරීම්, කාර්යසාධනය සහ වාර්තාකරණය යන සියල්ල දිගුකාලීන වටිනාකම් නිර්මාණය කිරීම සමඟ නිරන්තරයෙන් බද්ධ වී පවතින බව සහතික කරන අතර, අපගේ තිරසාරත්ව සැලැස්ම සහ ශක්තිමත් කරන ලද පාලන ව්‍යුහයන්, වගකීම්සහගත ලෙස මෙන්ම ඔරොත්තු දීමේ හැකියාවෙන් යුතුව වර්ධනය වීමට අපට මඟ පෙන්වයි.

කැපවූ කණ්ඩායම්, දත්ත මත පදනම් වූ වඩාත් පැහැදිලි නිරීක්ෂණ ධාරිතාවය සහ අනාගතයට සූදානම් ශ්‍රම බලකායක් සමඟින්, උපායමාර්ගයන් ප්‍රායෝගික ක්‍රියාවට නැංවීමටත්, එම ක්‍රියාවන් මැනිය හැකි ප්‍රතිඵල බවට පරිවර්තනය කිරීමටත් අප දැන් වඩාත් හොඳින් සන්නද්ධ වී සිටින්නෙමු. අප අනාගතය දෙස බලනුයේ සුභවාදී හැඟීමකින් සහ අලුත් වූ අධිෂ්ඨානයකිනි. නිරවද්‍යතාවයෙන් යුතුව ඉදිරියට යාමටත්, කාර්යසාධනය සහ පරිවර්තනය හමුවේ ඇති බාධක බිඳ දැමීමටත්, අපගේ පාර්ශවකරුවන්, පරිසරය සහ සමස්ත දේශය වෙනුවෙන් තිරසාර වටිනාකමක් නිර්මාණය කිරීමටත් අපි සූදානම්ව සිටින්නෙමු.

## ගෞරව පූර්වක ස්තූතිය

අධ්‍යක්ෂ මණ්ඩලය සහ නායකත්ව කණ්ඩායම වෙනුවෙන්, අපගේ සේවකයින්, ජාත්‍යන්තර මව් සමාගම්, ව්‍යාපාරික හවුල්කරුවන්, පාරිභෝගිකයින්, කොටස්කරුවන් සහ අප සේවය කරන සමස්ත ප්‍රජාව ඇතුළු අපගේ සියලුම පාර්ශවකරුවන් වෙත, වසර පුරා අප කෙරෙහි තැබූ විශ්වාසය, දැක්වූ කැපවීම සහ ලබා දුන් අඛණ්ඩ සහාය වෙනුවෙන් මම මාගේ අවංක කෘතඥතාව පිරිනමමි.

අපගේ මෙම ගමන් මඟ කෙරෙහි ඔබ තැබූ විශ්වාසය අපට මහත් ශක්තියක් වූ අතර, වඩාත් පැහැදිලි බවක්, අරමුණක් සහ අධිෂ්ඨානයක් සහිතව ඉදිරියටම යාමට එය අපව දිරිමත් කළේය. අපගේ පරිවර්තනීය ගමනේ මීළඟ අදියර වෙත අප පියවර තබන විට, අපගේ අවධානය යොමු වී ඇත්තේ හුදෙක් පවතින ප්‍රගතිය අඛණ්ඩව පවත්වා ගැනීමට පමණක් නොව, නිරවද්‍යතාවයෙන් යුතුව අපගේ වර්ධන වේගය තවදුරටත් වේගවත් කිරීම කෙරෙහි ය. එනම්, බාධක බිඳ දැමීම, සැමට ප්‍රතිලාභ ලැබෙන සහභාගීත්ව වර්ධනය ශක්තිමත් කිරීම සහ අපගේ සියලුම පාර්ශවකරුවන් වෙනුවෙන් තිරසාර දිගුකාලීන වටිනාකමක් නිර්මාණය කිරීමයි.

මෙයට විශ්වාසී,



ඒ. ජී. පණ්ඩිතගේ

කළමනාකාර අධ්‍යක්ෂ / සමූහ ප්‍රධාන විධායක නිලධාරී

2026 ජූනි 03

Augmented Reality - AR සමඟින් සුවිශේෂී අත්දැකීමක් විඳගන්න – QR කේතය ස්කෑන් කර, මුද්‍රිත වාර්තාව මතින් ඔබේ ස්මාර්ට් ජංගම දුරකථනය රඳවන්න

https://www.dimolanka.com/2025-2026-dimo-annual-report/url.php?id=8